සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදී යාම

I පත්‍රය = කාලය පැය 02 යි
වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

II පත්‍රය = කාලය පැය 03 යි
ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 07 කින්, 5 කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100 කි.

**අවසාන ලකුණු ගණනය කිරීම :**

I පත්‍රය = 100

II පත්‍රය = 100

**අවසාන ලකුණු** = $200 \div 2 = 100$

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ ✓ △ $\frac{4}{5}$

(ii) ............................................................ ✓ △ $\frac{3}{5}$

(iii) ............................................................ ✓ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.31 / 0830 - 1030

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** සන්නිවේදක සහ ග්‍රාහක භූමිකා හුවමාරුව සන්නිවේදන ආකෘතියක් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත්තේ,
(1) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය. (2) ශ්‍රාම් හා ඔස්ගුඩ් ය.
(3) ෂැනන් හා වීවර් ය. (4) ඩේවිඩ් කේ. බර්ලෝ ය.
(5) එඩ්වඩ් සැපීර් ය.

**2.** නිදහස් මතවාදයට විරුද්ධව කටයුතු කළ පුද්ගලයකු ලෙස සැලකෙන්නේ,
(1) ස්ටුවට් මිල් ය. (2) ජෝන් ලොක් ය.
(3) තෝමස් ජෙෆර්සන් ය. (4) ජෝසෆ් ගොබෙල්ස් ය.
(5) ජෝන් අර්ස්කින් ය.

**3.** සන්නිවේදකයාගේ සිතුවිලි, පණිවිඩ බවට පරිවර්තනය වීමේ ක්‍රියාවලිය හැඳින්වෙන්නේ,
(1) භාෂණය ලෙසයි. (2) සංජානනය ලෙසයි. (3) පරිකල්පනය ලෙසයි.
(4) සම්ප්‍රේෂණය ලෙසයි. (5) ආකේතිකරණය ලෙසයි.

**4.** සන්නිවේදනයේදී සන්නිවේදකයා අපේක්ෂා කළ ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීම වැදගත් වේ. මේ බව ඉස්මතු කර දක්වා ඇත්තේ,
(1) ශ්‍රාම්-ඔස්ගුඩ් ආකෘතියෙනි. (2) හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ නිර්වචනයෙනි.
(3) ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතියෙනි. (4) විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනයෙනි.
(5) ෂැනන් හා වීවර් ආකෘතියෙනි.

**5.** යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදන විධික්‍රමයක් වන්නේ,
(1) දුරකථනයයි. (2) ශබ්ද විකාශන යන්ත්‍රයයි. (3) ගුවන් විදුලි යන්ත්‍රයයි.
(4) පුරවැසි මාධ්‍යයයි. (5) මයික්‍රෆෝනයයි.

**6.** සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය හඳුන්වා දෙන ලද වැදගත්ම අංගය වන්නේ,
(1) මූලාශ්‍රයයි. (2) බලපෑමයි. (3) ඝෝෂාවයි. (4) ප්‍රතිපෝෂණයයි. (5) ග්‍රාහකයායි.

**7.** ඩේවිඩ්. කේ. බර්ලෝගේ ආකෘතියට අනුව මූලාශ්‍රය ලෙස හැඳින්වෙන්නේ,
(1) සිද්ධියයි. (2) අවස්ථාවයි.
(3) සන්නිවේදකයායි. (4) නිවේදකයායි.
(5) සංකල්පයයි.

**8.** ජනසන්නිවේදනය සෙසු සන්නිවේදන වර්ග අතුරෙන් වෙනස් වීමට හේතු වන්නේ එහි ක්‍රියාවලියේ දෘශ්‍යමාන
(1) කර්මාන්තමය ස්වභාවයයි. (2) සමජාතීය ග්‍රාහක ක්ෂේත්‍රයයි.
(3) සන්නිවේදක-ග්‍රාහක සමීපතාවයි. (4) සක්‍රිය ප්‍රතිපෝෂණයයි.
(5) අසන්තතික බවයි.

**9.** ස්ව සංකල්පය, ස්වයං සම්භාවනාව, ස්වයං ප්‍රතිරූපය (self image) යන අදහස් වඩාත් සම්බන්ධ වන්නේ,
(1) පුද්ගලාන්තර සන්නිවේදනයට ය. (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට ය.
(3) නිර්වාචික සන්නිවේදනයට ය. (4) උත්තේජන ප්‍රතිචාර න්‍යායට ය.
(5) දෙපියවර සංකල්පයට ය.

**10.** "ජාතික සංවර්ධනය යනු ප්‍රධාන වශයෙන් ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය හා සදාචාර සංවර්ධනය යන කොටස්වලින් පරිපූර්ණ වූ සංවර්ධනයයි." මේ අදහස ප්‍රකාශ කරන ලද්දේ,
(1) විල්බර් ශ්‍රාම් විසිනි. (2) ඩඩ්ලි සියර්ස් විසිනි.
(3) විමල් දිසානායක විසිනි. (4) එවරට් එම්. රොජර්ස් විසිනි.
(5) මහත්මා ගාන්ධි විසිනි.

**11.** රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට නිර්දේශ කරන ලද්දේ,
(1) වෛද්‍යනාදන් කොමිසමයි. (2) සෝල්බරි කොමිසමයි.
(3) වීරසූරිය කොමිසමයි. (4) තොරතුරු කොමිසමයි.
(5) හුළුගල්ල කොමිසමයි.

**12.** ඥාන ගවේෂණයේදී භාවිත කරන ශිල්ප විධියක් වන්නේ,
(1) සහානුභූතියයි. (2) සංස්ලේෂණයයි. (3) සමාජානුයෝජනයයි.
(4) සංකේන්ද්‍රනයයි. (5) සමජාතීකරණයයි. (Homogenization)

**13.** දෙපියවර සන්නිවේදන ආකෘතියට අනුව ජනතාව වෙත තොරතුරු සන්නිවේදනය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන්නේ,
(1) මාධ්‍යවේදීන් ය. (2) දොරටුපාලකයන් ය.
(3) බලපෑම් කණ්ඩායම් ය. (4) ජනමත නායකයන් ය.
(5) මාධ්‍ය හිමිකාරයන් ය.

**14.** ජනමාධ්‍ය මගින් කිසියම් සංසිද්ධියක් පිළිබඳ විෂයමූලික මෙන්ම විශ්ලේෂණාත්මක විග්‍රහයක් ලබා දීම සම්බන්ධයෙන් තීරණාත්මක සාධකය වන්නේ,
(1) වාර්තාකරණයයි. (2) දොරටුපාලනයයි. (3) හිමිකාරිත්වයයි.
(4) විචාරයයි. (5) සංස්කරණයයි.

**15.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මැතිවරණ ව්‍යාපාරවලදී ජනතා න්‍යාය පත්‍රය සකස් කරන්නේ ජනමාධ්‍යයයි.
(2) සහවේදනය මනාව තේරුම් ගැනීමට නම් අනුකම්පාව හා සැසඳිය යුතු ය.
(3) වාචික සන්නිවේදනය තුළ අවාචික ලක්ෂණ ද පවතියි.
(4) ජනමාධ්‍ය මගින් සමාජ යථාර්ථය නිසි ලෙස පිළිබිඹු වේ.
(5) භාෂාවක ශබ්ද හා අර්ථ අතර තර්කානුකූල සම්බන්ධතාවක් නැත.

**16.** ජනමාධ්‍ය නියාමනයට අයත් වීමේ අවම ඉඩක් ඇත්තේ,
(1) ආචාරධර්ම පද්ධති ස්ථාපනයයි. (2) ලියාපදිංචිකරණ ක්‍රියාවලියයි.
(3) නිසි බලධාරීන් පත් කිරීමයි. (4) අණ-පනත් සම්පාදනයයි.
(5) ස්වයං වාරණයයි.

**17.** නූතන ජනමාධ්‍යවල අවම වශයෙන් දක්නට ලැබෙන ලක්ෂණය ලෙස සැලකිය හැක්කේ,
(1) ජනවහර භාවිතයට ගැනීමයි. (2) සංවිධානගත බවින් යුක්ත වීමයි.
(3) වැඩි පෙළඹවීමකින් යුක්ත වීමයි. (4) උත්තේජනය ප්‍රයෝජනයට ගැනීමයි.
(5) පුද්ගල විභින්නතාව හඳුනා ගැනීමයි.

**18.** නිර්මාණාත්මක සන්නිවේදනයට ආවේණික කාර්යයක් **නොවන්නේ**,
(1) දත්ත විශ්ලේෂණයයි. (2) ආනන්දය ළඟා කර දීමයි.
(3) සමාජානුයෝජනය ඇති කරවීමයි. (4) ප්‍රඥාව උපදවීමයි.
(5) දෘෂ්ටිවාද සම්ප්‍රේෂණයයි.

**19.** පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් **නොවන** ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ,
(1) වාචික හා අවාචික ලක්ෂණවලින් යුක්ත වීමයි.
(2) ස්වයං සිද්ධ ලක්ෂණවලින් යුක්ත වීමයි.
(3) වර්ධනීය ලක්ෂණවලින් වියුක්ත වීමයි.
(4) පෙළඹවීම් ක්‍රියාවලියකින් යුක්ත වීමයි.
(5) සහවේදනය හා සම්බන්ධ වීමයි.

**20.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ඡායාරූප හා ග්‍රැෆික් නිර්මාණ දෘශ්‍ය කලාවට අයත් වේ.
(2) ග්‍රැෆික් නිර්මාණ රසවිඳීමට විශේෂ හැකියාවක් අවශ්‍ය වේ.
(3) චිත්‍ර හා ග්‍රැෆික් කලාවන්ට එකම නිර්මාණශීලී න්‍යායයක් අදාළ වේ.
(4) ඡායාරූප හා ග්‍රැෆික් නිර්මාණවලට පුහුණු කුසලතා අවශ්‍ය වේ.
(5) චිත්‍ර, ඡායාරූප හා ග්‍රැෆික් නිර්මාණ සඳහා විද්‍යුත් තාක්ෂණය සම්බන්ධ වේ.

**21.** ඉන්දියානු හා බංග්ලාදේශ චිත්‍රපට නැරඹූ විචාරකයෙක් 'සංසන්දනය සහ විශ්ලේෂණය' යන මාධ්‍ය විචාර ප්‍රවේශයෙන් ඒවා විචාරයට ලක් කර තිබුණි. එවැනි විචාර හා ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) චිත්‍රපටවල සංකල්ප, ශිල්පක්‍රම හා අන්තර්ගතය තක්සේරු කිරීම
(2) නිර්මාණකරණයේ සදාචාරාත්මක භාවිතය දැක්වීම
(3) චිත්‍රපට නිර්මාණය වූ පසුබිම, කාල වකවානු හා පුද්ගල චරිත විස්තර කිරීම
(4) සමාජය හා සමාජ සබඳතා විවරණය කිරීම
(5) චිත්‍රපට පිළිබඳ ප්‍රේක්ෂක ආකර්ෂණය ඇති වන ආකාරයට විචාරය කිරීම

**22.** පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.
A - ස්මාර්ට් ජංගම දුරකථනය (smart phone) යන්ත්‍ර සහායක සමූහ සන්නිවේදන මෙවලමක් ලෙස සැලකිය හැකි වේ.
B - පුරවැසි මාධ්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී බහුලව භාවිත වන සන්නිවේදන මෙවලම ලෙස ජංගම දුරකථනය සැලකිය හැකි ය.
C - දුරකථනය හා පරිගණකය ජනමාධ්‍ය තාක්ෂණය සමග සම්බන්ධ වීම මාධ්‍ය අභිසාරිතාවෙහි ප්‍රධාන සංසිද්ධියකි.

ඉහත ප්‍රකාශ පිළිබඳ දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A පමණක් සත්‍ය වේ.
(2) A හා B පමණක් සත්‍ය වේ.
(3) B හා C පමණක් සත්‍ය වේ.
(4) A, B, C යන සියල්ල සත්‍ය වේ.
(5) A, B, C යන සියල්ල අසත්‍ය වේ.

**23.** ජනශ්‍රැති හැදෑරීම සෑම නිර්මාණකරුවෙකුට ම වැදගත් වන බව විචාරකයෝ පෙන්වා දෙති. එයට හේතුව වන්නේ,
(1) ජනශ්‍රැතිවලින් ජන විඥානය හඳුනාගත හැකි වන නිසා ය.
(2) ජනශ්‍රැති ප්‍රාථමික මූලාශ්‍ර වන නිසා ය.
(3) ජනශ්‍රැති නිර්මාණශීලී වන නිසා ය.
(4) ජනශ්‍රැතිවලින් වස්තු බීජ සොයා ගත හැකි වන නිසා ය.
(5) ජනශ්‍රැතිවල ජනවහර පවතින නිසා ය.

**24.** ගොයම් කෙළීමට ආදේශකයක් ලෙස කොළ මඩින යන්ත්‍රය වේගයෙන් ව්‍යාප්ත වූ නිසා දේශීය ගොවි සංස්කෘතිය තුළ සිදු වූයේ,
(1) පාර සංස්කෘතිකකරණයකි. (Para-culturization)
(2) සංස්කෘතික ත්වරණයකි. (Cultural acceleration)
(3) සංස්කෘතික කම්පනයකි. (Cultural shock)
(4) සංස්කෘතික විසරණයකි. (Cultural diffusion)
(5) සංස්කෘතික ලැග්මකි. (Cultural lag)

**25.** නීතිය හා සාමය පවත්වාගෙන යාමේ අරමුණින් රටක සමාජ මාධ්‍ය වාරණය කරනු ලබන්නේ එම මාධ්‍යයේ සන්දේශ,
(1) ඉතා වේගවත්ව ග්‍රාහකයන් අතර පැතිර යන බැවිනි.
(2) විශ්වසනීයත්වයෙන් ඉහළ මට්ටමක පවතින බැවිනි.
(3) විශ්ලේෂණාත්මක ලෙස කරුණු ඉදිරිපත් වන බැවිනි.
(4) රූප හා හඬ කොටස් අවම ලෙස භාවිත වන බැවිනි.
(5) නිල මූලාශ්‍ර මත පමණක් තොරතුරු ඉදිරිපත් කරන බැවිනි.

**26.** මුද්‍රිත මාධ්‍ය පිළිබඳ පන්ති කාමරයේ පැවති සංවාදයකදී මතු වූ කරුණු මෙසේ ය.
නිමල් :- මුද්‍රිත මාධ්‍යයේ ප්‍රධාන උපකරණය භාෂාවයි.
කමල් :- රූප, වර්ණ සහ සිතුවම් ද ඊට එකතු කළ හැකි ය.
අමල් :- පොත්, සඟරා, පුවත්පත් ආදී වශයෙන් මුද්‍රිත මාධ්‍යයේ විවිධ ස්වරූප පවතී.
රමල් :- සාපේක්ෂව මුද්‍රිත මාධ්‍ය ප්‍රබල සක්‍රිය මාධ්‍යයකි.
විමල් :- මුද්‍රිත මාධ්‍ය බොහෝ විට පොදු භාෂාවක් යොදා ගනී.
මුද්‍රිත මාධ්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,
(1) නිමල්, කමල්, අමල් සහ රමල් ය. (2) කමල්, අමල්, රමල් සහ විමල් ය.
(3) නිමල්, කමල්, අමල් සහ විමල් ය. (4) නිමල්, කමල්, රමල් සහ විමල් ය.
(5) නිමල්, කමල්, අමල්, රමල් හා විමල් යන සියලු දෙනාම ය.

**27.** නව ලිබරල්වාදයට අනුව ගෝලීයකරණයේ ව්‍යාප්තියට අනුබල **නොදක්වන** සාධකය වන්නේ,
(1) පාරජාතික සමාගම්කරණයයි. (2) වෙළෙඳපොළ පුළුල්කරණයයි.
(3) නිර්බාධ වෙළෙඳාමයි. (4) ජාතික රාජ්‍ය ශක්තිමත් කිරීමයි.
(5) රාජ්‍යයෙන් ආර්ථිකය නිදහස් කිරීමයි.

**28.** 'ග්‍රාහක කේන්ද්‍රීය සන්දේශකරණය' යනුවෙන් අදහස් කරන්නේ,
(1) ග්‍රාහකයාට සන්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමයි.
(2) ග්‍රාහකයාට ගැළපෙන ලෙස සන්දේශ සකස් කිරීමයි.
(3) ග්‍රාහකයා වෙත සන්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිබඳව විමසා බැලීමයි.
(4) සන්දේශකරණයේදී සන්නිවේදකයාගේ අනන්‍යතාව නොසලකා හැරීමයි.
(5) ග්‍රාහකයින්ගේ සමාජ, සංස්කෘතික පසුබිම පිළිබඳ අවධානයෙන් තොරව සන්දේශ සකස් කිරීමයි.

**29.** ජනතා බැංකුවේ මුදල් තැන්පත් කර ඇති තැන්පත්කරුවන්ගේ පෞද්ගලික තොරතුරු, ප්‍රවෘත්ති වෙබ් අඩවියක් මගින් ප්‍රසිද්ධ කර තිබුණි. එමගින් බැංකුවේ ප්‍රතිරූපය බිඳවැටුණු බැවින් කරුණු පැහැදිලි කිරීමේ මාධ්‍ය සාකච්ඡාවක් කැඳවන ලදී. එවැනි අවස්ථාවකදී බැංකුවේ නිලධාරීන් වඩාත් අවධානය යොමු කළ යුත්තේ,
(1) පැමිණෙන මාධ්‍යවේදීන්ට හොඳ සංග්‍රහයක් සූදානම් කිරීමටයි.
(2) වටිනා ත්‍යාගයක් මාධ්‍යවේදීන්ට සිහිවටනයක් ලෙස පිරිනැමීමටයි.
(3) බැංකුවේ පැරණි වාර්ෂික වාර්තා පිටපත් මාධ්‍යවේදීන්ට ලබා දීමටයි.
(4) බැංකුව සිදු කරන ලද ප්‍රජා සේවා වැඩසටහන් විස්තර කිරීමටයි.
(5) ඉදිරිපත් විය හැකි ප්‍රශ්නවලට පිළිතුරු සූදානම් කර ගැනීමටයි.

**30.** විකල්ප මාධ්‍ය සම්බන්ධ වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) ජනප්‍රිය සංස්කෘතිය සමග සමීප සබඳතාවක් පවත්වයි.
(2) ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය සමග තරග කරයි.
(3) සමාජයේ විශාල පිරිසක් වෙත ගමන් කරනු ලබයි.
(4) මතවාදී කාර්යයට ප්‍රමුඛ තැනක් දෙනු ලබයි.
(5) උසස් මාධ්‍ය තාක්ෂණයක් පවත්වාගෙන යනු ලබයි.

**31.** සමකාලීන ජනප්‍රිය සංස්කෘතිය තුළ රූපවාහිනී මාධ්‍ය වඩාත් ම ප්‍රකට කරන ලක්ෂණයක් වන්නේ,
(1) සංස්කෘතිකාංගවල ආකර්ෂණයයි. (2) අල්පේච්ඡතාවයේ වටිනාකමයි.
(3) පරිභෝජනවාදයේ උත්කර්ෂණයයි. (4) බහුභාණ්ඩිකබවෙහි නිස්සාරිත බවයි.
(5) වටිනාකම්වල අනභිභවනීයත්වයයි.


**32.** මහජන සම්බන්ධතාව හා **නොගැළපෙන** අවස්ථාව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) සමාගමක් භාණ්ඩ හා සේවා මිල ගණන් සහිත දැන්වීමක් පළ කිරීම
(2) ආයතනයක් වාර්ෂික වාර්තා ප්‍රකාශයට පත් කිරීම
(3) පාසලක්, මාසික පුවත් හසුනක් පළ කිරීම
(4) විශ්වවිද්‍යාලයක් එහි 50 වන සංවත්සර ප්‍රදර්ශනය සංවිධානය කිරීම
(5) දේශපාලනඥයෙක් ක්‍රීඩා සංගම්වලට ක්‍රීඩා උපකරණ බෙදා දීම

**33.** පන්ති කාමරයේ පැවති සාකච්ඡාවකදී සිසුන් කිහිපදෙනකු ඉදිරිපත් කරන ලද ප්‍රකාශ පහත දැක්වේ.
නිමල් :- දැන්වීම් කියන්නේ වාණිජ අරමුණින් ඉදිරිපත් වන ප්‍රචාරයක්
විමල් :- මහජන සේවාවක් විදිහට ඉදිරිපත් වන දැන්වීම් දකින්නත් පුළුවන්
කමල් :- දේශපාලන දැන්වීම් මහජනයාට බලපෑම් කරනවා
අමල් :- සාපේක්ෂව දැන්වීම්කරණයෙන් සමාජයට වෙන්නේ යහපතක්
මාධ්‍ය දැන්වීම්කරණයට අදාළ ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ,
(1) නිමල් හා විමල් ය.　　(2) නිමල් හා කමල් ය.
(3) නිමල්, විමල් හා කමල් ය.　　(4) විමල්, කමල් හා අමල් ය.
(5) නිමල්, විමල්, කමල් හා අමල් යන සියලු දෙනාම ය.

**34.** මුද්‍රිත මාධ්‍යයේ තීරණාත්මක සාධක වන්නේ භාෂාව හා පාඨකයා ය. ඒ අනුව වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) පුවත්පත් වාර්තාකරණයේදී මාධ්‍යවේදියාගේ භාෂා අනන්‍යතාව ප්‍රකට නොවේ.
(2) කවි පොතක් රසවිඳීමේදී සහ පුවත්පතක කවි පිටුවක් රසවිඳීමේදී පාඨකයා සමාන අවධානයක් යොමු කරයි.
(3) ඡායාරූප, චිත්‍ර හා කාටූන් මුද්‍රිත මාධ්‍ය භාෂාවට අයත් නොවේ.
(4) නවකථාවක හා පුවත්පතක කොටස් වශයෙන් පළවන කථාවක පවතින්නේ එක හා සමාන ලක්ෂණයි.
(5) පොත්වලට හා සඟරාවලට පොදු භාෂාව යොදා ගැනීම යෝග්‍ය වේ.

● අංක **35** සිට **38** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූපසටහන භාවිතයට ගන්න.

※ පහත දැක්වෙන්නේ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය යැයි උපකල්පනය කරන්න.




**35.** ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියේ අන්තර්ගත මූලික අංගවලින් එක් අංගයක් ඉවත් කළ විට එය බර්ලෝ සන්නිවේදන ආකෘතියෙහි අන්තර්ගත අංග හා සමාන බවක් දක්වයි. එසේ සමාන වීමට ඉහත ආකෘතියේ අංග අතුරෙන් ඉවත් කළ යුත්තේ,
(1) A ය.　(2) B ය.　(3) C ය.　(4) D ය.　(5) E ය.

**36.** බර්ලෝගේ සන්නිවේදන ආකෘතියේදී එහි අන්තර්ගත එක් එක් මූලිකාංගය හා බැඳුණු ප්‍රධාන ලක්ෂණ පහ බැගින් ඉදිරිපත් කරයි. ඉහත 35 වන ප්‍රශ්නයේ පිළිතුරට අදාළ අංගය ඉවත් කළ පසු ඉතිරි අංග හතර බර්ලෝ සන්නිවේදන ආකෘතිය සමග සැසඳේ නම් එකී අංග හතර අතුරෙන් සමාන ලක්ෂණ දැකිය හැකි අංග දෙක වන්නේ,
(1) A හා B ය.　(2) A හා D ය.　(3) B හා C ය.　(4) B හා D ය.　(5) C හා E ය.

**37.** ඉහත ආකෘතියට ප්‍රතිපෝෂණය ඇතුළත් කළහොත් එහිදී පණිවිඩය ගමන් කරනුයේ,
(1) B සිට A දක්වා ය.　　(2) A සිට D දක්වා ය.
(3) D සිට A දක්වා ය.　　(4) E සිට A දක්වා ය.
(5) A සිට E දක්වා ය.

**38.** ඉහත ආකෘතිය ජනසන්නිවේදන අවස්ථාවක් හා ගැළපීමේදී පුවත්පත අදාළ වන අංගය වනුයේ,
(1) A ය.　(2) B ය.　(3) C ය.　(4) D ය.　(5) E ය.

**39.** පහත දී ඇති ප්‍රකාශ සැලකිල්ලෙන් කියවන්න.

A - කෙනෙකුගේ චිත්ත ස්වභාවය මතුපිටින් නොව ඇතුළතින් විමසා බැලීම

B - වෙනත් අයෙකුගේ භාවයන් තමන්ට ආරෝපණය කරගෙන එකී පාර්ශ්වය සමග අනන්‍ය වූ සංවේදනයක් ඇති කර ගැනීම

C - සමාජයීය ජීවිතය සාර්ථකව ගත කිරීමට අන්‍යයන්ගේ දුක සැප තේරුම් ගැනීම

ඉහත කී තත්ත්ව වඩාත් අදාළ වන්නේ,

(1) සංජානනයට ය. (2) අන්තර්වර්තී සන්නිවේදනයට ය.
(3) සමාජයීය සහජීවනයට ය. (4) සහානුභූතියට ය.
(5) ධ්‍රැවගත වීමට ය. (Polarization)

**40.** නිදහස් වෙළෙඳපොළ ක්‍රමය සහ මාධ්‍ය සංස්කෘතිය සම්බන්ධ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) විවෘත වෙළෙඳපොළ ක්‍රමය තුළ සාම්ප්‍රදායික සංස්කෘතිය සැලකිල්ලට ගනු ලබයි.
(2) මාධ්‍ය සංස්කෘතිය සකස් කිරීමට විශේෂඥයින්ගේ පර්යේෂණ නිරන්තරයෙන් භාවිතයට ගැනේ.
(3) සීමිත අවස්ථාවලදී හැර ව්‍යාපාරික ආධිපත්‍යයෙන් බැහැර වීමට මාධ්‍ය සංස්කෘතියට හැකියාවක් නැත.
(4) බොහෝ විට මාධ්‍ය සංස්කෘතිය විසින් එහි ව්‍යාපාරික අපේක්ෂා සඟවනු ලැබේ.
(5) වෙළෙඳපොළ ක්‍රමයට අවශ්‍ය පරිසරය සකස් කිරීම මාධ්‍ය සංස්කෘතිය මගින් සිදු කරයි.

**41.** පහත දැක්වෙන්නේ ස්ව සංකල්පය පිළිබඳ සාකච්ඡාවකදී සිසුන් දැක්වූ ප්‍රකාශ කිහිපයකි.

රුවන් :- ස්ව සංකල්පය යනු යම් පුද්ගලයකු තමන්ව අන් පුද්ගලයන්ට දක්නට සලස්වන ආකාරයයි.
රාම් :- එය මැනීමට නොහැකි ය.
රහීම් :- උප්පත්තියෙන්ම පැමිණෙන්නකි.
රොජර් :- කාලාන්තරයක් තුළ වෙනස් විය හැකි ය.

ස්ව සංකල්පය පිළිබඳ නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කරන්නේ,

(1) රහීම් සහ රාම් විසින් වන අතර රුවන් සහ රොජර් නොවේ.
(2) රුවන් සහ රහීම් විසින් වන අතර රාම් සහ රොජර් නොවේ.
(3) රුවන් සහ රොජර් විසින් වන අතර රාම් සහ රහීම් නොවේ.
(4) රාම් සහ රොජර් විසින් වන අතර රුවන් සහ රහීම් නොවේ.
(5) රුවන්, රාම්, රහීම් සහ රොජර් යන සියල්ලන්ම ය.

**42.** ගෝලීයකරණ සන්දර්භය තුළ ජනමාධ්‍යයේ ලක්ෂණයක් **නොවන්නේ**,

(1) එකම පණිවිඩයක් විවිධත්වයෙන් යුත් ග්‍රාහක කණ්ඩායමකට යොමු කිරීම ය.
(2) සාපේක්ෂ වශයෙන් අක්‍රිය පාරිභෝගික කණ්ඩායමක් දක්නට ලැබීම ය.
(3) පොදු අනන්‍යතාවලට වඩා පුද්ගල අනන්‍යතා සඳහා ප්‍රමුඛත්වය හිමිවීම ය.
(4) පවත්නා සමාජ රටාව ස්වාභාවික තත්ත්වයක් බව මහජනයාට පිළිගැනීමට සැලැස්වීම ය.
(5) සමාජයේ බලරහිත වූවන් නිහඬකරවීමේ ප්‍රවණතාවක් පැවතීම ය.

**43.** ගැටුම් විසඳීම සම්බන්ධ විශේෂඥයින් ගැටුම් ආශිර්වාදයක් ලෙස විග්‍රහ කරන්නේ,

(1) ගැටුම් සමාජයට සජීවී බවක් ලබාදෙන බැවිනි.
(2) ගැටුම් සමාජයට ප්‍රවෘත්ති ජනනය කරන බැවිනි.
(3) ගැටුම් සමාජ විපර්වර්තනයට අත්‍යාවශ්‍ය බැවිනි.
(4) ගැටුම් නිසා ඇතැම් පාර්ශ්වවලට වාසි අත් කරගත හැකි බැවිනි.
(5) ගැටුම් මතු වීම සමාජ පාලනය පහසු කරවන බැවිනි.

**44.** අලුත්ම චිත්‍රපටය තිරගත වී නොබෝ දිනකින් එය පිළිබඳ විවිධ ආයතනවල, විවේකාගාරවල සහ ආපනශාලාවල කතාබහ කිරීමට යොමු වීම එහි ජනප්‍රියත්වය වැඩි වීමට බලපෑවේ ය. ඒ අනුව ජනප්‍රියත්වය වැඩි වීමට වඩාත් හේතු වූයේ,

(1) පුද්ගලාන්තර සන්නිවේදනයයි. (2) වාචික සන්නිවේදනයයි.
(3) ජනප්‍රිය සංස්කෘතියයි. (4) අව්‍යිමත් සන්නිවේදනයයි.
(5) ජනසන්නිවේදනයයි.

**45.** මාධ්‍ය භෞතික සංස්කෘතිය ඇතුළු තාක්ෂණයේ සිදුවන සීඝ්‍ර වර්ධනයට සමගාමීව මාධ්‍ය සාක්ෂරතාව හා කුසලතා වර්ධනය නොවීම සමකාලීන මාධ්‍ය සංස්කෘතිය මුහුණපාන ගැටලුවකි. සංස්කෘතික අධ්‍යයනයෙහිදී මෙය හඳුන්වන්නේ,

(1) සංස්කෘතික පරිහානිය ලෙස ය.
(2) සංස්කෘතික විසරණය ලෙස ය.
(3) සංස්කෘතික ත්වරණය ලෙස ය.
(4) සංස්කෘතික ලැග්ම ලෙස ය.
(5) සංස්කෘතික විවිධත්වය ලෙස ය.

**46.** ජනමාධ්‍ය සංස්කෘතිය පිරිහීම සම්බන්ධව අදාළ පාර්ශ්ව කටයුතු නොකරන හෙයින් එම තත්ත්වය වැළැක්වීම සඳහා පනතක් ගෙන එන බව රජයේ මාධ්‍ය ප්‍රකාශකයා විසින් පවසන ලදී. මෙහිදී ක්‍රියාත්මක වන්නේ,

(1) සමාජ ප්‍රජාතාන්ත්‍රිකරණ සන්නිවේදන සංකල්පයයි.
(2) සමාජ වගකීම් සන්නිවේදන සංකල්පයයි.
(3) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පයයි.
(4) සෝවියට් කොමියුනිස්ට් සන්නිවේදන සංකල්පයයි.
(5) අධිපතිවාදී සන්නිවේදන සංකල්පයයි.

**47.** ලොව විවිධ රටවල රජය සහ මාධ්‍ය අතර ඇති සම්බන්ධතාවේ ස්වභාවය පිළිබඳ පන්තියේදී ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පහත දැක්වේ. ඒවා අතුරින් බහුලව දක්නට ලැබෙන තත්ත්වය කුමක් ද?

(1) මාධ්‍ය හිමිකාරිත්වය සහ පාලනය රජයේ ඒකාධිකාරයක් ලෙස පවතී.
(2) මාධ්‍ය හිමිකාරිත්වය පෞද්ගලික අංශය සතු වන අතර පාලනය රජය මඟින් සිදු වේ.
(3) මාධ්‍ය හිමිකාරිත්වය පෞද්ගලික අංශය සතු වුවත් රාජ්‍ය පාලනයෙන් නිදහස් වේ.
(4) මාධ්‍ය හිමිකාරිත්වය හා පාලනය යන දෙඅංශයම රාජ්‍ය පාලනයෙන් නිදහස් වේ.
(5) මාධ්‍ය හිමිකාරිත්වය හා පාලනය රජය සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් සිදු වේ.

**48.** පහත දැක්වෙන්නේ මාධ්‍ය සංස්කෘතික සංසරණයේ අසමබරතාවට අදාළ ප්‍රකාශ කිහිපයකි.

A - ඒක මාර්ගික ක්‍රියාවලියක් වීම
B - පෙරදිග මතවාද හෙළාදැකීම
C - බටහිර මතවාදවලට ගරු කිරීම
D - වටිනා අංග හුවමාරු කර ගැනීම

මේවා අතුරෙන් වඩාත් ගැළපෙන ප්‍රකාශ වන්නේ,

(1) A හා B ය.
(2) B හා C ය.
(3) C හා D ය.
(4) A, B හා C ය.
(5) B, C හා D ය.

**49.** ප්‍රාථමික පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් පාසල් සංවර්ධන සමිතිය මගින් ආරම්භ කරන ලදී. එහි කාර්යසාධනය ව්‍යාපෘති කළමනාකරණ පත්‍රිකාවක් ඇසුරෙන් විමසා බැලීමට තීරණය විය.

ව්‍යාපෘති කළමනාකරණ පත්‍රිකාවක ඇතුළත් විය යුතු මූලික කරුණු කිහිපයක් වන්නේ,

(1) අරමුණු, අයවැය, සංවිධාන ව්‍යුහය හා සීමා ය.
(2) අයවැය, උපායමාර්ග, කාර්යපථය හා අපේක්ෂිත ප්‍රතිඵල ය.
(3) මූල්‍ය සම්පත්, භෞතික සම්පත්, මානව සම්පත් හා ඇගයුම් ක්‍රියාවලිය ය.
(4) අදාළ කාර්යයන්, කාල රාමුව, තීර්ණායක හා වගකීම් ය.
(5) අරමුණු, උපායමාර්ග, සම්පත් හා කාල රාමුව ය.

**50.** මාධ්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - මාධ්‍ය සාක්ෂරතාවෙහි පදනම ලිවීමට හා කියවීමට ඇති හැකියාවයි.
B - මාධ්‍ය සාක්ෂරතාව වැඩිපුර අදාළ වන්නේ මුද්‍රිත මාධ්‍ය සම්බන්ධයෙනි.
C - මාධ්‍ය අන්තර්ගතය තේරුම් ගෙන පරිහරණය කිරීම මාධ්‍ය සාක්ෂරතාවයි.
D - සන්දේශ නිර්මාණය හා ඇගයීම මාධ්‍ය සාක්ෂරතාවෙහි අංගයක් වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) A පමණක් සත්‍ය වේ.
(2) B පමණක් සත්‍ය වේ.
(3) C පමණක් සත්‍ය වේ.
(4) A හා B සත්‍ය නමුත් C හා D අසත්‍ය වේ.
(5) A හා B අසත්‍ය නමුත් C හා D සත්‍ය වේ.

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂය අංකය / பாட இலக்கம்: 29　　විෂයය / பாடம்: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 1 | 31. | 3 | 41. | 4 |
| 02. | 4 | 12. | 2 | 22. | 4 | 32. | 1 | 42. | 2 |
| 03. | 5 | 13. | 4 | 23. | 1 | 33. | 4 | 43. | 3 |
| 04. | 2 | 14. | 2 | 24. | 2 | 34. | 1 | 44. | 4 |
| 05. | 1 | 15. | 4 | 25. | 1 | 35. | 5 | 45. | 4 |
| 06. | 3 | 16. | 5 | 26. | 3 | 36. | 2 | 46. | 2 |
| 07. | 3 | 17. | 1 | 27. | 4 | 37. | 3 | 47. | 5 |
| 08. | 1 | 18. | 1 | 28. | 2 | 38. | 3 | 48. | 4 |
| 09. | 2 | 19. | 3 | 29. | 5 | 39. | 4 | 49. | 5 |
| 10. | 3 | 20. | 3 | 30. | 4 | 40. | 2 | 50. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

**1. සන්නිවේදන ක්‍රියාවලිය යනු නියාමනය කරන ලද්දකි.**

**(i) සමාජය තුළ ක්‍රියාත්මක වන අවිධිමත් සන්නිවේදන දාම දෙකක් නම් කරන්න.**

1. තනි දාමය (Single Strand Chain)
2. ඕපාදූප දාමය (Gossip Chain)
3. සම්භාවිතා දාමය (Probability Chain)
4. පර්ෂද දාමය (Cluster Chain)

*ලකුණු 1 x 2 = 2*

**(ii) පුද්ගලාන්තර සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි නව මාධ්‍ය විධික්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න.**

1. විද්‍යුත් තැපැල E-mail
2. සමාජ ජාල (Facebook, My Space)
3. ස්කයිප් Skype
4. කෙටි පණිවිඩ (SMS, MMS) ස්මාට් දුරකථන මගින්
5. Applications (Apps) - Viber Messenger, Whats app, Instagram, Telegram

*ලකුණු 2 x 2 = 4*

(iii) ජනසන්නිවේදනයේ මූලික ලක්ෂණ **හතරක්** සඳහන් කර, ඉන් **දෙකක්** පිළිබඳ සටහන් සපයන්න.

1. විධිමත් සංවිධානාත්මක ආයතනික ව්‍යුහයක් පැවතීම.
2. වෘත්තීය මාධ්‍යවේදීන්ගේ දායකත්වය
3. පොදු සංදේශ සම්ප්‍රේෂණය කිරීම.
4. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර පවතින දූරස්ථ සම්බන්ධතාව පැවතීම.
5. බහුවිධ දොරටුපාලකයින් සිටීම.
6. ප්‍රමාදී ප්‍රතිපෝෂණයක් පැවතීම.
7. දියුණු තාක්‍ෂණික ක්‍රම උපයෝගී කර ගැනීම.
8. කර්මාන්තමය ස්වභාවයක් ගැනීම.
9. විසිරී පැතිරී සිටින විෂම ග්‍රාහකත්වය
10. ක්‍ෂණික හා අඛණ්ඩ බව
11. පියවර ගණනාවකින් යුක්ත වීම

**නම් කිරීම** $^1/_2$ x 4 = 2

**විස්තර කිරීම** *2 x 2 = 4*

***මුළු ලකුණු = 6***

(iv) නිර්වාචික සන්නිවේදනයේ අංග **හතරක්** විස්තර කරන්න.

ලිඛිත හෝ කථිත වචන භාවිතයෙන් තොරව සිදුවන සන්නිවේදනය නිර්වාචික සන්නිවේදනයයි.

1. සංඥා සංකේත
2. මුහුණේ ඉරියව්
3. ඇස් සම්බන්ධතාව
4. බාහිර පෙනුම (ඇඳුම්, ආභරණ, විලාසිතා)
5. උපකරණ
6. පාර භාෂාව
7. අංග චලන
8. ස්පර්ශය
9. අවකාශය

***ලකුණු 2 x 4= 8***

**2.** නිර්මාණාත්මක චින්තනය නිසා අපූර්වත්වයකින් ලෝකය දකිමින් නව සංවර්ධන ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මිනිසාට හැකි වී තිබේ.

(i) ජනමාධ්‍ය සන්දේශ විග්‍රහ කිරීමේදී අවධානය යොමු කරන 'නිර්මාණශීලී කියවීම' යන්නට අදාළ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

1. මාධ්‍ය මගින් ලැබෙන සංදේශ නිර්මාණශීලීව ග්‍රහණය කරගැනීම.
2. පුද්ගල අනුභූතීන් සමග සම්බන්ධ කරගැනීම.
3. සංදේශයක යටිපෙළ කියවා ගැනීම.
4. සංදේශය නිර්මාණයේදී පාදක කරගත් ශිල්පීය විවිධතා හඳුනා ගැනීම.
5. සංදේශයට අදාළ සන්දර්භය පිළිබඳ අවබෝධය.

**ලකුණු** *1 x 2 = 2*

(ii) ජනජීවිතයේදී ජන ගී වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු **හතරක්** දක්වා, ඉන් **එකක්** ගැන කෙටියෙන් විස්තර කරන්න.

(ii)
1. විවේකය විනෝදයෙන් ගත කිරීම සඳහා
2. පාළුව කාංසිය මගහරවා ගැනීම සඳහා
3. දැනුම සම්ප්‍රේෂණය කිරීම සඳහා
4. සමාජ ජීවිතයේදී සිදුවන ගැටලු ප්‍රකාශනය සඳහා
5. උපදෙස් ලබාදීම සඳහා
6. භාව ප්‍රකාශනය සඳහා
7. වෘත්තීයමය කාර්යය සඳහා (පතල්, ගැල්, ගොයම්)
8. ඇදහිලි විශ්වාස සඳහා
9. සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා
10. විරෝධාකල්ප මත ප්‍රකාශනය සඳහා

**නම් කිරීමට ලකුණු** $^1/_2$ x 4 = 2

**විස්තර කිරීම ලකුණු** *2 x 1 = 2*

**මුළු ලකුණු** *= 4*

**(iii) නිර්මාණාත්මක සංවර්ධන ව්‍යාපෘතියකදී අවසන් වාර්තාවට ඇතුළත් කරන කරුණු හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න.**

1. අරමුණු
2. අයවැය හා සම්පත් යොදාගත් අයුරු
3. අනුග්‍රාහකත්වය හා විශේෂඥ උපදේශනය
4. මුහුණදුන් ගැටලු/අතපසුවීම්
5. ලැබිය හැකි වූ ජයග්‍රහණ
6. සාර්ථක/අසාර්ථක බවට බලපෑ හේතු
7. ඉදිරිපත් කරන නිර්දේශ /නිගමන/යෝජනා
8. ව්‍යාපෘති කණ්ඩායම හා සම්බන්ධ තොරතුරු

***ලකුණු $1\frac{1}{2}$ X 4 = 6***

**(iv) ඉගෙනුම් මෙවලමක් ලෙස ජනමාධ්‍ය පහත අවස්ථාවන්හිදී යොදා ගත හැකි ආකාරය පිළිබඳ වචන 200 කට නොඅඩු රචනාවක් ලියන්න.**
**(අ) භාෂාව ඉගෙනීම (වචන 100)**
**(ආ) සමාජානුයෝජනය (වචන 100)**

(iv) (අ) **භාෂාව ඉගෙනීම**

1. නිර්මාණාත්මක භාෂා කුසලතා වර්ධනය කරගැනීම.
2. විවිධ ලේඛන රටා හඳුනාගැනීම.
3. භාෂාව නිවැරදිව උච්ඡාරණය කර ගැනීම.
4. අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ විධි පිළිබඳ අවබෝධය
5. රූප භාෂාව ඇසුරින් වචනාර්ථ තේරුම් ගැනීමේ හැකියාව.
6. සම්මත භාෂාව හා ව්‍යවහාර භාෂාව අතර වෙනස්කම් හඳුනාගැනීම සඳහා

***ලකුණු 2 x 2 = 4***

(ආ) **සමාජානුයෝජනය**

1. සමාජ වටිනාකම් හඳුනාගැනීම.
2. පුද්ගල ප්‍රතිරූප මගින් සමාජානුයෝජනය වීම.
3. චාරිත්‍ර වාරිත්‍ර හඳුනා ගැනීම.
4. ඇදහිලි විශ්වාස හඳුනා ගැනීම.
5. නව චර්යා හඳුනා ගැනීම.
6. නව ප්‍රවණතා හඳුනා ගැනීම.
7. නව දැනුම/අදහස්/මතවාද/සංකල්ප හඳුනා ගැනීම.
8. මාධ්‍යයෙන් ඉදිරිපත් වන චරිත අනුකරණය කිරීම.
9. මාධ්‍ය මගින් ඉදිරිපත් වන චරිතයන්හි ගති ලක්ෂණ තමා වෙත පවරා ගැනීම (තදාත්මීකරණය)
10. මාධ්‍ය මගින් පෙන්වන චරිත සැබෑලෝකයේ රඟ දැක්වීම (භූමිකා රංගනය)

***ලකුණු 2 x 2 = 4***

***මුළු ලකුණු =8***

**3. (i) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ හතරක් සඳහන් කරන්න.**

1. ජනමාධ්‍ය මගින් ගොඩ නැගීම
2. තාක්ෂණය සමග ප්‍රබල සම්බන්ධයක් පැවතීම
3. ගතික බව
4. ව්‍යාපාරික ආධිපත්‍යයක් පැවතීම
5. ගෝලීයකරණය හා සමීප සබඳතාවක් පැවතීම
6. මාධ්‍ය සංස්කෘතිය මගින් කෘත්‍රිම අවශ්‍යතා නිර්මාණය කිරීම
7. ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම
8. පුද්ගල ආකල්ප හා චර්යාවන්ගේ වෙනස්කම් ඇති කිරීම
9. නව ස්වරූපයක සමාජ රටාවක් ගොඩ නැංවීම
10. සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්ව හා මාධ්‍ය සංස්කෘතිය අතර සබඳතාවක් පැවතීම

***ලකුණු 1/2 x 4 = 2***

**(ii) ජනසන්නිවේදන ක්‍රියාවලියේදී සන්දේශයට සිදුවන හානිය ප්‍රධාන බාධක වර්ග දෙකට අදාළව නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.**

1. **මාධ්‍ය බාධක** - ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී සන්නිවේදනයේ සිට ග්‍රාහකයා දක්වා සන්දේශයක් ගමන් කිරීම් ක්‍රියාවලියට සිදුවන බාධාවන්ය.

පුවත්පත - තීන්ත බොඳවීම, ඡායාරූප අපහැදිලි වීම,
ගුවන් විදුලිය - සංඛ්‍යාත පද්ධතියේ දුර්වලතා, ප්‍රතිවාදනය වීම
රූපවාහිනිය - රූපරාමු අපැහැදිලි වීම, රූපවාහිනි තරංග දුර්වල වීම

2. **අර්ථ බාධක** - සංදේශයේ අර්ථය හරිහැටි අවබෝධ කරගැනීමට නොහැකි වීම නිසා සිදුවන බාධාවන්ය.

පුවත්පත - විරාම ලකුණු පද බෙදීම් අපැහැදිලි වීම, විදග්ධ භාෂාවක් යොදා ගැනීම
ගුවන්විදුලිය - සංදේශය ඉදිරිපත් කරන භාෂාව අපැහැදිලි වීම
උච්චාරණ දෝෂ
රූපවාහිනිය - තාක්ෂණික හෝ පාරිභාෂික වචන වැඩි වශයෙන් යොදා ගැනීම
උච්චාරණ කිරීමේ දෝෂ

***ලකුණු 2 x 1 = 2***
***ලකුණු 2 x 1 = 2***
***මුළු ලකුණු = 4***

(iii) පුවත්පත් කතුවැකිය වැදගත් වන්නේ ඇයි දැයි දැක්වීමට **හේතු හතරක්** සඳහන් කර, ඉන් **දෙකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

1. පුවත්පතේ දැක්ම ප්‍රකාශ වීම
2. කාලීන වැදගත්කමක් සහිත වීම
3. ජනතාව වෙත අවධාරණය කළයුතු වැදගත් කරුණු සහිත වීම
4. පිළිගත් සම්මත ලේඛන රටාවක් සහිත වීම
5. මාධ්‍ය ආයතනයේ මතය හඳුනා ගත හැකි වීම
6. ජන මතයන් ගොඩ නැංවීමට උපකාරී වීම
7. නව මතවාද ගොඩ නැගීමට උපකාරී වීම
8. සංවිධානාත්මක තාර්කානුකූල සාධක සහිත ලියවිල්ලක්වීම

***නම් කිරීම ලකුණු 1/2 x 4 = 2***
***විස්තර කිරීමට 2 x 2 = 4***
***මුළු ලකුණු = 6***

(iv) සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විවිධ මත ප්‍රකාශ කළ බටහිර විද්වතුන් **හතරදෙනකු** නම් කර, ඉන් දෙදෙනකු සංවර්ධනයට අදාළව ඉදිරිපත් කළ කරුණු **දෙක** බැගින් ගෙන වෙන වෙන ම විස්තර කරන්න.

1. විල්බර් ශ්‍රාම්
2. එවරට් එම් රොජර්ස්
3. ඩැනියල් ලර්නර්
4. ලූෂන් පායි
5. ඉතියෙල් ද සෝලා පූල්

**විල්බර් ශ්‍රාම්**

- ජාතික සංවර්ධනයට ජන මාධ්‍ය යොදා ගත හැකි ආකාරය විස්තර කිරීම

1. ජාතිකත්වය පිළිබඳ හැඟීම තහවුරු කිරීමට යොදා ගැනීම
2. ජාතික අපේක්ෂාවන් උසස් මට්ටමකට පත් කිරීමට යොදා ගැනීම
3. සාම්ප්‍රදායික සමාජයන් හි නව හැකියාවන් ව්‍යාප්ත කරලීම සඳහා යොදා ගැනීම
4. පොදු ජනතාව පාලන ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම
5. සංවර්ධන වැඩ සටහන් කෙරෙහි මහජන ප්‍රතිචාර ලබා ගැනීමට

**එවරස්ට් එම් රොජර්ස්**

- ශ්‍රාම්ගේ අදහස් ඔස්සේ රොජර්ස් මතු කළ කරුණු

1. නවෝත්පාදන විසරණය (Diffusion of Innovations ) සඳහා භාවිතයට ගැනීම
2. ජාතික න්‍යාය පත්‍රය සැකසීම
3. ජන සන්නිවේදන හා පුද්ගලාන්තර සන්නිවේදනය අතර පැවතිය යුතු සබඳතාව
4. ජන සන්නිවේදනය හා අධ්‍යාපනය අතර ඇති සබඳතාව
5. සංවර්ධනය පිළිබඳ අවබෝධයක් ඇති කරලීම සඳහා ජනමාධ්‍ය භාවිතයට ගැනීම

### ඩැනියල් ලර්නර්

මැදපෙරදිග කලාපයට විශේෂිතව කරන ලද පර්යේෂණ ඇසුරින් ලර්නර් නව මතවාද ඉදිරිපත් කළේය.

1. නාගරීකරණය
2. සාක්ෂරතාව
3. ජනමාධ්‍ය භාවිතය
4. දේශපාලන සහභාගීත්වය

මීට අමතරව අදහස් මතවාද වෙනස් කිරීමේ ක්‍රියාවලියට සහවේදනය (Empathy) බලපාන බවද පෙන්වා දී තිබේ. මෙම සාධක අතර අන්තර් සම්බන්ධතාවක් ඇති බව ලර්නර් විග්‍රහ කළේය.

### ලූෂන් පායි

පෞද්ගලික මත, සංකල්ප සමාජීය පදනමක් තුළ ඉදිරිපත් කිරීම හා විග්‍රහ කිරීම ජනමාධ්‍ය තුළින් ඉටුවිය යුතු බව ලූෂන් පායි පෙන්වා දේ. සන්නිවේදන ක්‍රියාවලිය හා දේශපාලන ක්‍රියාවලිය අතර ඇති සබඳතා ඔහු ඒ ඔස්සේ විග්‍රහ කරයි. ජනමාධ්‍ය තුළින් තොරතුරු ලබා ගැනීමෙන් පසු දේශපාලනය පිළිබඳව තුලනාත්මක අවබෝධයක් ලබා ගත හැකි වීම මෙහි ඇති විශේෂත්වයයි.

### ඉතියෙල් ද සෝලා පූල්

සමාජ නවීකරණය හා දේශපාලන සහභාගීත්වය යන අංශයන්හි ජනමාධ්‍යයෙන් ඉටුවන මෙහෙයේ ඇති වැදගත්කම ඔහු පෙන්වා දී තිබේ. සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජනමාධ්‍ය විධිමත්ව භාවිත කිරීමට නොහැකි වී ඇත්තේ එම කරුණු කෙරෙහි පාලක පක්ෂය ගන්නා තීරණවල අඩුපාඩු නිසා බව වැඩිදුරටත් පෙන්වා දී තිබේ. ඒ ඔස්සේ ඔහු ප්‍රධාන ප්‍රශ්න හතරක් මතු කරයි

1. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් තමන් සතුව ඇති සම්පත්වලින් කොපමණ කොටසක් ජනමාධ්‍ය සඳහා ආයෝජනය කළ යුතු ද?
2. ජනමාධ්‍ය ක්‍රියාවලියෙහි පෞද්ගලික අංශයට හා රාජ්‍ය අංශයට හිමිවිය යුතු යුතුකම් වගකීම් හා අයිතිවාසිකම් මොනවාද?
3. ජනමාධ්‍ය කොතරම් නිදහස් විය යුතුද? කොතරම් දුරට රජයේ පාලනයට යටත් විය යුතු ද?
4. ජනමාධ්‍යයන්ගෙන් ඉදිරිපත්වන ලිපි ලේඛන, වැඩ සටහන් යනාදිය කුමන බුද්ධි මට්ටමක රසඥතාවයට හා සංස්කෘතික පසුතලයකට අනුරූපව සකස් විය යුතු ද?

***නම් කිරීම ලකුණු 1/2 x 4 = 2***
***1 විස්තර කිරීම මුළු ලකුණු 1 1/2 x 2 = 3***
***2 විස්තර කිරීම මුළු ලකුණු 1 1/2 x 2 = 3***
***මුළු ලකුණු = 8***

**4. (i) අංකිත මුද්‍රණ ක්‍රමයේ වැදගත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.**

1. වේගයෙන් මුද්‍රණය කරගත හැකි වීම
2. ගුණාත්මක බව
3. ආකර්ෂණීය නිමාව
4. කළු, සුදු හෝ වර්ණ වශයෙන් මුද්‍රණය කරගත හැකි වීම
5. විවිධ ප්‍රමාණයන්ගෙන් මුද්‍රණය කරගත හැකි වීම
6. විවිධ ද්‍රව්‍ය (රෙක්සින්, කඩදාසි) මත මුද්‍රණය කර ගත හැකි වීම

**ලකුණු** *1 x 2 = 2*

**(ii) ගෝලීය මාධ්‍යයන්හි සංස්කෘතික සංසරණයේ අසමබරතාව පෙන්නුම් කරන කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.**

1. බටහිර මතවාදීමය ආධිපත්‍යයක් පෙන්නුම් කිරීම.
2. සංස්කෘතික සංසරණය ඒකමාර්ගික ක්‍රියාවලියක් වීම
3. බටහිර නොවන (ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා) සංස්කෘතික වටිනාකම් ඇගයීමට ලක් නොවීම
4. බටහිරට නැඹුරු චර්යාත්මක හෝ අනුකරණාත්මක අංග පමණක් සංසරණයට භාජනය වීම
5. මාධ්‍ය සංස්කෘතිය නිර්මාණය කිරීමේ උපායමාර්ග තීරණය කිරීමේ දී බටහිර කරණය පදනම් කර ගැනීම

**ලකුණු** *2 x 2 = 4*

**(iii) මහජන සම්බන්ධතා කටයුතුවලදී ඡායාරූප භාවිත කළ හැකි ආකාර හතරක් දක්වා, ඉන් දෙකක් පහදන්න.**

1. මුද්‍රිත මාධ්‍ය සඳහා භාවිතය (පෝස්ටර්, අත්පත්‍රිකා, පුවත්පත්, සඟරා)
2. ඡායාරූප ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
3. මාධ්‍ය නිවේදනයක් සමඟ ඡායාරූප යොමුකිරීම.
4. දින දර්ශනවල ඡායාරූප යොමුකිරීම.
5. විශාලනය කර ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම
6. වෙබ් අඩවියක ප්‍රදර්ශනය කිරීම.
7. සමාජ ජාල වෙත යොමු කිරීම.

**නම් කිරීම ලකුණු** *1/2 x 4 = 2*
**පැහැදිලි කිරීම** *2 x 2 = 4*
**මුළු ලකුණු** *= 6*

**(iv) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි හතරක් උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න.**

1. ප්‍රසිද්ධියේ නම් කිරීම
2. දැන්වීම් මගින් පාලනය කිරීම
3. බලපත්‍ර නිකුත් කිරීම/අවලංගු කිරීම/පවරා දීම
4. බදු පැනවීම
5. නිසි බලධරයෙක් පත් කිරීම
6. ත්‍යාග සහ සංග්‍රහ ලබාදීම.
7. දඬුවම් කිරීම
8. දඩ නියම කිරීම
9. මාධ්‍ය ආයතනවලට අලාභ හානි සිදු කිරීම/ගිනි තැබීම.
10. තනතුරු වල වෙනස්කම් සිදු කිරීම
11. තහනම් කිරීම
12. මාධ්‍යවේදීන්ට පහර දීම/ තර්ජනය කිරීම/ ජීවිත හානි සිදුකිරීම
13. මාධ්‍ය ආචාරධර්ම හා ස්වයං වාරණය ආශ්‍රිතව

(උදාහරණ සහිතව විස්තරකර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න)

**ලකුණු** *4 x 2 = 8*

**5. (i) "සංස්කෘතිය යනු අංග රැසක එකතුවකි." මැලිනොවුස්කි නමැති මානව විද්‍යාඥයාගේ අර්ථකථනයට අනුව සංස්කෘතියක අන්තර්ගත මූලික අංග හතරක් නම් කරන්න.**

1. උපකරණ
2. පාරිභෝගික ද්‍රව්‍ය
3. සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ
4. මානව සංකල්පනා
5. ශිල්ප
6. විශ්වාස
7. චාරිත්‍ර

***ලකුණු 1/2 x 4 = 2***

**(ii) "සංස්කෘතියක ඇති වන විවිධ වෙනස්කම් සංස්කෘතික කම්පනයට හේතු විය හැකි ය." සංස්කෘතික කම්පනයට බලපාන හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.**

1. විරෝධි සංස්කෘතීන් අතර ඇතිවන ගැටුම්කාරී තත්වය
2. තම සංස්කෘතියේ වටිනාකම් වෙනස් සංස්කෘතියක් විසින් යටපත් කිරීම
3. නව සංස්කෘතිකාංග එක් පිරිසක් භාර ගැනීම හා තවත් පිරිසක් ප්‍රතික්ෂේප කිරීම
4. සාමාජීය සම්ප්‍රදායන් දැඩිව පැවතීම
5. එක් සංස්කෘතියකින් නුහුරු සංස්කෘතියකට මාරු වීම

***ලකුණු 2 x 2 = 4***

**(iii)** **"ගෘහස්ථ සාමය හා සහජීවනය දේශීය සංස්කෘතියෙහි ඉහළ ඇගයීමකට ලක් වේ." ගෘහස්ථ සාමය හා සහජීවනය නොමැති පවුලක් තුළ දැකිය හැකි සන්නිවේදන ගැටලු තුනක් විස්තර කරන්න.**

1. එලදායී කථනයෙන් තොරවීම
2. ප්‍රශස්ථ ඉඟි, ඉරියව්, හැසිරීම් නොමැති වීම
3. ප්‍රතිචාර ප්‍රතිපෝෂණ ක්‍රියාවලියට බාධා ඇති වීම
4. සංජානනය දුර්වල වීම
5. නිවස තුළ ජන මාධ්‍ය භාවිතයේ ගැටලු ඇති වීම
6. සහානුභූතිය නොමැති වීම
7. පවුලේ සාමාජිකයින්ගේ අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන ක්‍රියාවලිය බිඳ වැටීම
8. සාමාජිකයින් අතර කතාබහ අඩු වීම
9. සැක සංකා හට ගැනීම
10. ආවේගශීලී වීම
11. පවුලේ ගැටලු සඳහා විසඳුම් සොයා ගැනීමට අසීරු වීම

***ලකුණු 2 x 3 = 6***

**(iv)** **"ප්‍රධාන සංස්කෘතික ධාරාව හා ප්‍රධාන ධාරාවේ මාධ්‍ය අතර සමීප සබඳතාවක් තිබිය හැකි ය." ඉහත තත්ත්වයට එරෙහිව ක්‍රියාත්මක වන විකල්ප මාධ්‍ය සතු ලක්ෂණ හතරක් විස්තරාත්මකව පහදන්න.**

1. ප්‍රධාන ධාරාවේ මාධ්‍යයට වෙනස් වූ වාර්තාකරණ ස්වරූපයක් පැවතීම
2. ලාභය මත පදනම් නොවීම
3. අවම පහසුකම් හා අවම පිරිවැයකින් පවත්වාගෙන යාම
4. නව සමාජ මතවාදයක් ගොඩ නැගීම
5. සීමිත ග්‍රාහක පිරිසක් ඉලක්ක කරා ගැනීම හා එමගින් සමාජයට විශාල බලපෑමක් ඇති කිරීම
6. පාරිභෝගිකවාදයට, ජනප්‍රිය සංස්කෘතියට හා බහුජන සංස්කෘතියට එරෙහිව පවත්වා ගෙන යාම
7. එක් පුද්ගලයෙකු හෝ කීපදෙනෙකු විසින් ආරම්භ කර පවත්වාගෙන යාම
8. ඇතැම් අවස්ථාවල ලියාපදිංචි කිරීමෙන් තොරව රහසිගතව පවත්වාගෙන යාම

***ලකුණු 2 x 4 = 8***

**6. භාෂාව, මිනිසා විසින් සොයා ගත් විශිෂ්ට උපකරණයකි.**
**(i) භාෂාව ඇසුරෙන් චිත්ත රූප මැවීමේ හැකියාව හඳුන්වන යෙදුම නම් කරන්න.**

පරිකල්පනය *ලකුණු 2 x 2 = 4*

**(ii) "ජීව භාෂාවක් හඳුනාගැනීමේදී ඊට ආවේණික වූ ලක්ෂණ පවතී." එබඳු ලක්ෂණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.**

1. දෛනිකව සන්නිවේදන කාර්යය සඳහා භාවිත කිරීම
2. නිරන්තරයෙන් පෝෂණය වන හා වෙනස්වන සුළු බවකින් යුක්ත වීම
3. අඛණ්ඩව භාවිත කිරීම
4. අදාළ ප්‍රජාවට පහසුවෙන් අවබෝධ කර ගත හැකි වීම
5. නිර්මාණශීලීව අදහස් ප්‍රකාශ කිරීමට හැකි වීම
6. වචනවල අර්ථය සන්දර්භය අනුව වෙනස් වීම
7. වචනවලට නව අර්ථ ජනනය කිරීම
8. අවශ්‍යතාවන්ට අනුව ප්‍රකාශන විධි සකස් වීම
9. සජීවී බවකින් යුක්ත වීම *ලකුණු 1 x 4 = 4*

**(iii) ජනමාධ්‍යයේදී භාෂා භාවිතයේ සීමා දක්නට ලැබේ. පුවත්පත, ගුවන් විදුලිය යන එක් එක් මාධ්‍යයට බලපාන එවැනි සීමා තුන බැගින් කෙටියෙන් විස්තර කරන්න.**

**පුවත්පතේ භාෂා භාවිත සීමා**

1. උප භාෂා භාවිත කළ නොහැකි වීම
2. විදග්ධ භාෂා භාවිතයට නොහැකි වීම
3. ප්‍රාදේශීය භාෂා භාවිත කළ නොහැකි වීම
4. අදහස් වඩා පැහැදිලිව ඉදිරිපත් කිරීමට රූපමය උදව්වක් ලබා ගැනීමට සිදු වීම
5. පොදු සම්මත භාෂාවෙන් බැහැර වීමට නොහැකි වීම
6. සදාචාරාත්මක සීමාවන් නිසා භාෂාව ප්‍රවේශමෙන් පරිහරණය කිරීමට සිදු වීම

**ගුවන් විදුලියේ භාෂා භාවිත සීමා**

1. ගුවන් කාලය මත භාෂාව සීමා වීම
2. සරල සුගම භාෂාවක් භාවිත කිරීමට සිදු වීම
3. සංකීර්ණ අදහස් ප්‍රකාශනයට අපහසු වීම
4. සංඛ්‍යා දත්ත විස්තරාත්මක දැක්වීමට නොහැකි වීම
5. එක සමාන වචන එක ළඟ භාවිතය නොහැකි වීම
6. උප භාෂා භාවිතය කළ නොහැකි වීම
7. සදාචාරාත්මක සීමාවන් නිසා භාෂාව ප්‍රවේශමෙන් පරිහරණය කිරීමට සිදු වීම

*1 ලකුණු 1 x 3 = 3*
*2 ලකුණු 1 x 3 = 3*
***මුළු ලකුණු = 6***

**(iv) නව මාධ්‍ය භාවිතයේ දක්නට ලැබෙන භාෂාමය ප්‍රවණතා හතරක් නිදසුන් සහිතව පහදන්න.**

1. විවිධ සංඥා සංකේත බහුලව භාවිතය
2. භාෂාව සම්මිශ්‍රව යොදා ගැනීම
3. සංක්ෂිප්ත භාෂා රටාවන් භාවිත කිරීම
4. භාෂාවේ ලුහුඬු ව්‍යවහාර බහුලව යොදා ගැනීම
5. භාෂා රීති නොසලකා හැරීම
6. දේශීය භාෂා ඉංග්‍රීසි අක්ෂරවලින් ලිවීම
7. ඉමේජ්, ස්ටිකර්, හැඟීම් ප්‍රකාශිත මුහුණු රූප භාවිතය
(සම්පූර්ණ ලකුණ ලබා දීම සඳහා උදාහරණ සහිතව දැක්විය යුතුය)

*ලකුණු 2 x 4 = 8*

**7. (i) 'සංවර්ධනය' නිර්වචනය කිරීමේදී ඩඩ්ලි සියර්ස් පෙන්වා දුන් කරුණු හතර සඳහන් කරන්න.**

1. දරිද්‍රතාව
2. සාක්ෂරතා ඥානයේ පහත මට්ටම
3. විරැකියාව
4. සමාජ අසමානතාව

***ලකුණු ½ x 4 = 2***

**(ii) සංවර්ධන සන්නිවේදනයේදී සාම්ප්‍රදායික මාධ්‍ය භාවිතයේ ඇති යෝග්‍යතාව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.**

1. ජනතාවට සමීප මාධ්‍යයක් වීම
2. විශ්වසනීයත්වය තහවුරු වීම
3. ජනතාවට හුරුපුරුදු සංඥා සංකේත වලින් යුක්ත වීම
4. ග්‍රාහකයාගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබාගත හැකිවීම
5. ගැමි ජනතාවට අවබෝධ කර ගත හැකි පොදු මාධ්‍යය වීම
6. ගැමි ජනතාව තුළ උත්තේජනයක් ඇති කළ හැකි වීම
7. අවම පිරිවැයක් සහිත වීම
8. වින්දනාත්මක ස්වභාවය නිසා පොළඹවා ගැනීමට පහසු වීම

***ලකුණු 2 x 2 = 4***

**(iii) සිනමා මාධ්‍යය රූපවාහිනී මාධ්‍යයට වඩා වෙනස් වන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පහදන්න.**

1. ප්‍රබල කලා මාධ්‍යයකි
2. පෞද්ගලිකව නරඹන මාධ්‍යයකි
3. අඳුර සමග මුසුවූ මාධ්‍යයකි
4. සංශ්ලේෂී මාධ්‍යයකි
5. පුළුල් තිරය, තීව්‍ර හඬ සහිතයි
6. සජීවී (Live) තොරතුරු ලබාදිය නොහැකි වීම
7. මුදල් ගෙවා නරඹන මාධ්‍යයකි
8. සාපේක්ෂව පිරිවැය අධික මාධ්‍යයකි
9. සිනමා ශාලාවකට ගොස් නරඹන මාධ්‍යයකි

*ලකුණු 2 x 3 = 6*

**(iv) නිර්මාණකරුවාට මෙන්ම ග්‍රාහකයාට ද මාධ්‍ය විචාරය ප්‍රයෝජනවත් වේ. විචාරය හා සම්බන්ධ, නිර්මාණකරුවාට වැදගත් වන කරුණු දෙකක් හා ග්‍රාහකයාට වැදගත් වන කරුණු දෙකක් වෙන වෙන ම පැහැදිලි කරන්න.**

මාධ්‍යය විචාරය **නිර්මාණකරුවාට** වැදගත් වන ආකාරය

1. තම නිර්මාණය පුළුල්ව විමර්ශනය කර ගැනිමට
2. නිර්මාණයේ ගුණදොස් අවබෝධ කර ගැනීමට
3. ඉදිරි නිර්මාණ සඳහා මග පෙන්වීමට
4. සමාජීය අවශ්‍යතාව අනුව නිර්මාණ දිශාගත කර ගැනීමට
5. නව නිර්මාණ බිහි කිරීම සඳහා නිර්මාණ කරුගේ චින්තනය මෙහෙයවීමට

මාධ්‍යය විචාරය **ග්‍රාහකයාට** වැදගත් වන ආකාරය

1. මාධ්‍ය සංදේශ විනිවිද දැකීමට
2. ග්‍රාහක ශක්තිය වර්ධනය කරගැනීමට
3. සංජානනය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට
4. ග්‍රාහකයා හා මාධ්‍ය අතර ගනුදෙනුව සක්‍රිය කරගැනීමට
5. දුරවබෝධ සහිත තැන් පැහැදිලි කර ගැනීමට

*1. ලකුණු 2 x 2 = 4*

*2. ලකුණු 2 x 2 = 4*

***මුළු ලකුණු = 8***